චක්‍රලේඛ අංක: 07/2017 (1)

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක : 109, 4 වන මහල,
මහා වීදිය,
බත්තරමුල්ල.
2017.07.24

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>කළමනාකරණ අවදානම් දීමනා ගෙවීම.</u>**

උක්ත කරුණට අදාලව නිකතු කරන ලද 04/2014, 02/2016 සහ 07/2017 චක්‍රලේඛයන් පහත සඳහන් සංශෝධනයන් සහිතව නැවත නිකුත් කිරීමට බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

| වැටුප් පරිමාණය | තනතුර | කළමනාකරණ අවදානම් දීමනාව |
|---|---|---|
| **101:03**<br>**101:02**<br>**101:01**<br>**101 (විශේෂ)** | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම | රු.3,000 -රු.5,000 අතර |
| **102:04** | කළමනාකරණ මට්ටම | රු.2,500 -රු.3,500 අතර |
| **102:05** | කළමනාකරණ මට්ටම | රු.2,000 - රු.3,000 අතර |
| **102:06** | කළමනාකරණ මට්ටම | රු.1,500 - රු.2,500 අතර |

02. ඉහත දීමනා හිමිවීම සඳහා පහත කොන්දේසි සපුරාලිය යුතුය.

I බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලත් සේවය ස්ථිර වූ නිලධාරියෙකු හෝ නිලධාරිණියක් විය යුතුය.

II වැඩ බැලීමේ / රාජකාරී ඉටුකිරීමේ පදනම මත පත්කරන සිටින නිලධාරීන් සඳහා මෙම දීමනාව හිමිවන්නේ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පත්වීම් කාල සීමාව සඳහා පමණක් වන අතර, වැඩ බැලීම සඳහා පත් කර සිටින නිලධාරීන් සඳහා ඉහත දීමනාව සම්පූර්ණයෙන් ද, රාජකාරී ඉටුකිරීමේ පදනම මත පත්කර සිටින නිලධාරීන් සඳහා හිමිවන්නේ නියමිත දීමනාවෙන් අඩක් ද ගෙවිය යුතු වේ. වැඩ ආවරණය සඳහා පත් කර සිටින නිලධාරීන්ට මෙම දීමනාව හිමි වන්නේ නැත.

03. මෙම දීමනාව පාරිතෝෂික ගණනය කිරීමේ කාර්යය සඳහා අදාල නොවේ.

04. කොමිෂන් සභා අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත පත් කර සිටින නිලධාරීන්ගේ කොන්ත්‍රාත් දීමනාව තීරණය කිරීමේ දී මෙම දීමනාව සැලකිල්ලට ගැනීමෙහි බාධාවක් නොමැත.

කොමිෂන් සභා නියමය පරිදිය.

එස්. ජී. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යංශය, බස්නාහිර පළාත.
III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ/ගම්පහ/කළුතර)
V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
VIII. සියළුම වෘත්තීය සමිති සංගම්